**ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව - 2015**

-----------------------------------------------------

ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 9 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. කමිටුවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කමිටුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කමිටුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** මූල්‍ය ප්‍රකාශන

**2.1** තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.2.1** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ප්‍රමිතයේ පරිච්ඡේද 2 හි 2.52 වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම්කරණ ප්‍රමිතිවලින් අවසර දී ඇති විටෙක හැර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වත්කම් හා වගකීම් හිළව් නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී පෞද්ගලික බැංකුවක පැවති රු. 1,514,367 ක් වූ අවාසිදායක බැංකු ශේෂය එම බැංකුවේ තවත් ගිණුමක වූ රු. 6,290,365 ක වාසිදායක බැංකු ශේෂයට හිළව්කර ශුද්ධ අගය රු. 4,775,998 ක් ලෙස ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

**2.2.2** ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සත්කාරක රටින් ප්‍රතිපූරණය කර ගත යුතු විදේශ ගමන් වියදම් රු.786,540 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කලින් ගෙවීම් ලෙස දක්වා තිබුණි.

(ආ) 2005 වර්ෂයේදී කැබිනට් තීන්දුවක් මගින් රූඩ් 01 පර්චස් 20 ක් වූ ඉඩම ජාතික ඔලිම්පික් කමිටු ප්‍රධාන කාර්යාලයට පවරාදී තිබුණද එහි වටිනාකම ගිණුම් පොත් වලට ගෙන නොතිබුණි.

(ඇ) ගෙවිය යුතු ආදායම් බදු රු. 14,938 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

**2.3** නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 19 වන වගන්තිය | අමාත්‍යවරයා විසින් ජාතික ඔලිම්පික් කමිටුවේ ක්‍රියාකාරීත්වය හා යුතුකම් පිළිබඳ නියෝග පැනවිය යුතු වුවද කමිටුවේ ක්‍රියාකාරීත්වය හා යුතුකම් සඳහා අත්‍යවශ්‍ය ගිණුම් කටයුතුභාවය, නිලවරණය වැනි කටයුතුවලට අදාළ නියෝග පනවා නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 757 (2) | 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර ඇති බව වාර්තා කර තිබුණද අදාළ සමීක්ෂණ වාර්තාව මෙම වාර්තාවේ දින වනවිටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛයේ 03 ඡේදය | අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකය මගින් ජාතික ඔලිම්පික් කමිටුවේ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය ප්‍රතිඵලය රු.11,054,453 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,785,500 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.15,839,953 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ වියදම රු.45,318,905 කින් අඩු වී තිබුණද ආදායම රු.61,158,858 කින් අඩුවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුළදී ඔලිම්පික් ක්‍රියාකාරකම් සඳහා සත්කාරක රටවල් වලින් ගුවන් ටිකට් පත් වියදම් ඇතුළුව විදේශ ගමන් වියදම් සඳහා රු. 3,478,818 ක මුදලක් ලැබී තිබූ අතර ඊට අදාළ ගෙවීම් වශයෙන් රු. 7,565,845 ක මුදලක් වැයකර තිබුණි. ඒ අනුව ලද මුදල ඉක්මවා රු. 4,087,027 ක් කමිටුවේ අරමුදලින් ගෙවීම්කර තිබුණි.

### 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2013 වර්ෂය තුළ ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුවේ 75 වන සංවත්සරයට සමගාමීව රු.5,200,000 ක මුදලකට "සමරු පොත්" 2000 ක් මුද්‍රණය කර සැපයීමේ කාර්යය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව පුද්ගලික ආයතනයක් තෝරාගෙන තිබුණු අතර ගිවිසුමකට එළැඹීමකින් තොරව කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. එම කාර්යය සඳහා 2013 සැප්තැම්බර් 30 දින කොන්ත්‍රාත්තු වටිනාකමින් සියයට 50 ක්වූ රු. 2,600,000 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. මෙම වාර්තාවේ දින වන විටත් එම කාර්යය ඉටු කර ගෙන නොතිබූ අතර අත්තිකාරම් මුදල වූ රු. 2,600,000 ක මුදලද අදාළ කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කමිටුවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) මූල්‍ය පාලනය | (i) දිගුකාලීනව ආයෝජනය කළ හැකි අතිරික්ත මුදල් කෙටිකාලීන ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබීම.<br>(ii) විදේශ ගමන් වෙනුවෙන් වෙනත් රටවලින් ලැබෙන මුදලට වඩා වියදම් කර තිබීම. |
| (ආ) සේවක ණය පාලනය | සේවක ණය ගෙවීමේදී ණය ගිවිසුම් අත්සන් කර නොතිබීම. |
| (ඇ) ගිණුම්කරණය | ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් පැවතීම. |